# "ශ්‍රී සිද්ධාර්ථ ගෞතම" බුදුන්ට අගෞරව කරන චිත්‍රපටියක්.

## දයාවංශ ජයකොඩි

**ආසියා ආලේක පදනම වෙනුවෙන් නවීන් ගුණරත්න නිෂ්පාදනය කළ සමන් වීරමන් අධ්‍යක්ෂණය කළ "ශ්‍රී සිද්ධාර්ථ ගෞතම" චිත්‍රපටිය පසුගිය 24 වැනිදා සිට ඊ.ඒ.පී මණ්ඩලයේ සිනමා ශාලාවල ප්‍රදර්ශනය ආරම්භ කළා. "සිද්ධාර්ථ" චිත්‍රපටය ප්‍රදර්ශනය ආරම්භවෙත් ම මෙරට පොත් ප්‍රකාශකයින් අතර ඉහළින්ම වැජඹෙන, විශේෂයෙන් ම බෞද්ධ පොත පත ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රකාශකයෙකු වන දයාවංශ ජයකොඩි මහතා මෙම චිත්‍රපටය පිළිබඳ වෙනස්ම මතවාදයක සිටින බව දැනගන්නට ලැබුණා. මෙවර අපේ කතා බහ වෙන්වූයේ ඔහු "සිද්ධාර්ථ" චිත්‍රපටය පිළිබඳ පළකළ අදහස් වෙනුවෙනි.**



**ඔබ "සිද්ධාර්ථ" චිත්‍රපටය පිළිබඳ දැනගත්තේ කොහොමද?**
මෙවැනි චිත්‍රපටයක් හැදෙනවා කියන භාහෝව පුවත්වලින්, ජනමාධ්‍යවලින් දැනගත්තා.

**මේ දැනගැනීමෙන් පසු ඔබ චිත්‍රපටය නරඹන්න ගියාද?**
නෑ මම චිත්‍රපටය නරඹන්න ගියේ නෑ. ඒ චිත්‍රපටය නැරඹීමට මගේ කිසිම අදහසකුත් නෑ.

**එතකොට ඔබ මේ චිත්‍රපටය ගැන කතා කරන්නේ චිත්‍රපටය නරඹන්නේ නැතුවද?**
ඔව්. නමුත් මේ චිත්‍රපටයේ පූර්ව ප්‍රචාරක පටය(ට්‍රේලර් එක) මම නැරඹුවා. ඒකත් මට නරඹන්න සිද්ධ වුණේ අහම්බෙන්. මම ඊයේ පෙරේදා දවසක "තලාෂ්" කියන හින්දි චිත්‍රපටය නරඹන්න ගියා. ඒ චිත්‍රපටය නරඹන අතරතුර තමයි "සිද්ධාර්ථ" චිත්‍රපටයේ ට්‍රේලර් එක මම දැක්කේ. ඒක දැකපු මොහොතේ සිට මගේ හිත කම්පාවට පත්වුණා.

**ඇයි ඒ?**

දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් සමන්විත වූ අපේ බුදුරජාණන් වහන්සේගේ තරුණ අවධිය ඒ කියන්නේ සිද්ධාර්ථ කුමාරයා ගේ චරිතය නළුවෙක් රඟපානව දකිනකොට මගේ හිත වේදනාවට පත් වුණා. බුදුරජාණන් වහන්සේගේ කුමාර අවදියට සමකළ හැකි, ඒ චරිතය රඟ පෑ හැකි කෙනෙක් මේ ලෝකයේ සිටිය හැකිද? බුදුරජාණන් වහන්සේට ගෞරව කරන, උදේ හවස බුදුන් වඳින මා වැනි හොඳ බෞද්ධයකුට එය වේදනාවට කාරණයක්.

මේක සම්පූර්ණයෙන් ම බුදුරජාණන් වහන්සේට කරන අගෞරවයක්. අපි නොයෙක් විට අහලා දැකලා තිබෙනවා බුදුනු වහන්සේගේ රුව ටී-ෂර්ට්වල ගහපු අවස්ථා, සපත්තු අඩිවල ගහපු අවස්ථා, කාන්තා යට ඇඳුම්වලට යොදාගන්නා අවස්ථා.

මේ සියළු දේට වඩා උන්වහන්සේගේ චරිතය මෙවැනි ගිහි නළුවෙකු ලවා රඟපෑම බුදු දහමට කරන ලොකුම අගෞරවයක් විදියට මම දකිනවා. අනිත් එක තමයි මේ චිත්‍රපටය හදපු අය තේරුම් අරන් තිබෙනවා මේ චරිතය ලංකාවේ කිසිම නළුවෙකුට රඟපාන්න බැරි බව.

ඒත් එහි සිදුහත් චරිතය හෝ බුද්ධ චරිතය කිසිවකුත් නිරූපණය කළේ නෑ. "මහින්දාගමනය" චිත්‍රපටයේ මිහිඳු මහ රහතන් වහන්සේ පවා චරිතයක් හැටියට හඳුන්වා දුන්නේ නෑ.

කොහොම වුණත් මේවායේ මූලික පරමාර්ථය වුණේ මුදල් ඉපයීම, හොඳ දෙයක් සමාජයට තිළිණ කිරීම නොවෙයි. අද පන්සල්වල පවා මුල්තැන ලැබෙන්නේ මුදල් උපයන දේවල්වලට. බුදු හාමුදුරුවන්ගේ පාමුල ඉස්සරලම දකින්න තිබෙන්නේ පිංකැටේ. පිං කැටයක් නැති එකම බෞද්ධ සිද්ධස්ථානයයි මම දැකලා තියෙන්නේ. ඒ මහමෙවුනා අසපුව.

**ක්‍රිස්තුස් වහන්සේගේ චරිතය නම් විවිධ අවස්ථාවල විවිධ නළුවන් රඟ පා තිබෙනවා නේද?**
ඔව්. නමුත් ඒ චරිතය රඟපාපු නළුවන් කවුරුත් අද ජීවතුන් අතර නෑ.

**ඔබ කියන්නේ "සිද්ධාර්ථ" වැනි චිත්‍රපටයක් නිෂ්පාදනය නොවිය යුතුයි කියලද?**
ඔව්. ඒකෙන් වෙන්නේ බුදුරජානන් වහන්සේට අගෞරවයක්. අනෙක් පැත්තෙන් මේ චිත්‍රපටය නරඹන අපේ අනාගත පරපුර වැරදි ආදර්ශ ගන්න පුළුවන්. සුද්ධෝදන රජ්ජුරුවෝ කවුද ඇහුවම "රන්ජන් රාමනායක" කියලා උත්තර දෙන්නත් අනාගතයේ බැරිකමක් නෑ.

දෙතිස් මහා පුරුෂ ලක්ෂණවලින් සමන්විත ඒ අසම සම බුදුරජානන් වහනසේගේ සිදුහත් චරිතය මේ කොහෙවත් යන පැගිරි නළුවෙකුට රඟපාන්න පුළුවන්ද? මම බෞද්ධයකු හැටියට කෙනෙකුට විපතක් වෙනව දකින්න කැමැති නෑ. නමුත් මෙවැනි අගෞරවනීය වැඩවලට එකතුවන හැමදෙනාටම දිට්ඨ ධම්මවේදනීය කර්මය පළ දෙන්න පුළුවන්.

**ඔබ මීට ප්‍රථම මේ ආකාරයෙන් ම "සූරිය අරණ" චිත්‍රපටයේ ට්‍රේලරය දැක චිත්‍රපටය ගැන යම් ප්‍රකාශ කළා නේද?**
ඔව්. මම හිතනවා "සූරිය අරණ" දුවන්න ඒකත් හේතුවක් වුණා කියලා.

**බෞද්ධ පොත පත ප්‍රකාශයට පත් කරන ප්‍රකාශකයකු විදියට ඔබටත් කෙනෙක් චෝදනා කළොත් ඔබත් කරන්නේත් බුදු බණ විකිණීම කියලා?**
ව්‍යාපාරිකයකු හැටියට මගේ මේ ප්‍රකාශ මට පාඩුවෙන්න පුළුවන්. කෙනෙකු මට එහෙම චෝදනා කරන්නත් පුළුවන්. ඒ වුණාට මම බෞද්ධ පොත් පත් පළ කරන්නේ මුදල් ඉපයීමේ පරමාර්ථයෙන් නෙවෙයි. ධර්ම පොත පත වලින් ලැබෙන ලාභයෙන් සම්පූර්ණයෙන් ම මම යොද-වන්නේ බුද්ධ ශාසනයේ දියුණුවට. කොහොම නමුත් මේ ප්‍රශ්නය පිළිබඳ මේ රටේ විද්වත් ස්වාමීන් වහන්සේලාගේ තර්ක විතර්ක මම බලාපොරොත්තු වෙනවා. මම වැරදි නම් මට ඉගෙන ගන්න කියලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

(සංවාදයට විවෘතයි)

**හේමාලි විජේරත්න**

---

## මගේ දිනපොත

ගිය සෙනසුරාදා මම කැම්බවෙල් ගර්ල්ස් ග්‍රැමර් පාසලේ විභාගයකට ගියා. මම ගියේ මගේ යාළුවා සමඟයි. එතන 6, 8 සහ 10 ය වසරේ ළමයින් සිටියා. විභාගයට ලියන්න තිබුනේ ඉංග්‍රීසි සහ ගණිතය යන විෂයයන්ය. අන්තිමේදී කතාවක් ලියන්නත් තිබුණා. මම හිතනවා මම ඒ විභාගය හොඳින් කළා කියලා.

### මල්ෂි ගමලත්

7 - 8 ශ්‍රේණිය
සිංහල භාෂා පාසල රොක්ස්බර්ග් පාක්

---

අද මගේ ඥාති සහෝදරිය ඉපදුණා. එදාම රෑ අපි රෝහලට ගියා නැන්දවය බලන්න. නැන්දගේ ඇඳ පැත්තෙ චූටි තොටිල්ලක් තිබුණා. ඒක ඇතුලේ ලස්සන, රෝස පාට බබෙක් හිටියා. දකිනකොටම මට ආදරේ හිතිලි වඩාගත්තා. වඩාගන්නකොට පුළුන් ගෙඩියක් වඩාගන්නවා වගේ. චුට්ටක්වත් බර නෑ ! මම එයාට ගොඩක් ආදරෙයි.

### නිරූනි අබේසිරිගුණවර්ධන

7 - 8 ශ්‍රේණිය
සිංහල භාෂා පාසල රොක්ස්බර්ග් පාක්

මම අද උදේ අවදි වුණා.

මම ස්කෝලෙ ගියා.
පාසලෙන් අපිට මෙල්බර්න් කෞතුකාගාරය බලන්න එක්කරගෙන ගියා.
අපි ගොඩක් චිත්‍ර දැක්කා.

මම ස්කෝලෙ බසයෙන් ගෙදර ආවා.

### තරුෂි දන්දෙනි

7 - 8 ශ්‍රේණිය
සිංහල භාෂා පාසල රොක්ස්බර්ග් පාක්

---

උදෑසන පිබිදුන මම පාසැල් යෑම සඳහා සූදානම් වූයේ බස් රථයට වෙලාවට යෑම සඳහාය. බස් රථයට පය තැබූ මම දුටුවේ මගේ මිතුරියන් සැමය. අත වනා වාඩි වූ මම පාසලට යන තුරු බලා සිටියේ නොයිවසිල්ලෙනි. පාසලට ගිය පසු සූදානම් වූයේ මගේ පළමු විෂයය සඳහාය. ඒ ඉංග්‍රීසි විෂයයි. අපි සැවෝම ඉතා අසාවෙන් බලා සිටියේ ගුරුතුමිය ඇතුළට පැමිණෙන තුරුය. ඇය ඉතා කරුණාවන්ත ගුරුතුමියකි. ඒ වගේම ඉතා හැඩ රුවයි. පාසැල අවසානයේ අපි සියල්ලෝම "ආයුබෙ-ර්වන්" කියා ගෙදර පිටත් වූවෙමු.

### හිරුෂි පෙරේරා

7 - 8 ශ්‍රේණිය
සිංහල භාෂා පාසල රොක්ස්බර්ග් පාක්

## පුංචි අපට - පුංචි උපදෙස්

එකමත් එක රටක මිනිසෙක් සිටියා. ඔහුගේ නම ජෝන්. දවසක්දා ජෝන් රස්සාවක් සොයා ගැනීමට හැම තැනම ඇවිද්දා. අන්තිමට ඔහුට යන්නට සිදු වුනේ මුරකාර තනතුරු ඉල්ලාගෙනය.

"මට හරිම කණගාටුයි. ලිවීමට හෝ කියවීමට බැරි ඔබ වගේ කෙනෙකුට මෙතන වැඩ කරන්න බැහැ" යැයි අයිතිකරුවා කියුවා.

ජෝන්ට දැඩි කණගාටුවක් දැනුණි. ඔහු ගෙයින් ගෙට ගිහින් බඩු වෙළඳාම් කිරීමට පටන්ගත්තේය. වසර ගණනාවක් ගත වෙද්දී සාප්පුවක් දැමීමට තරම් අවශ්‍ය මුදල් ඔහු වෙත තිබිණි. ඔහු කොතරම් මහන්සි වී වැඩ කළේද යත් දිනෙන් දින සාප්පුව වැඩි දියුණු විය. වසර දහයක් අවසා-නයේදී ඔහු සාප්පු තුනක් හිමි ධනවතෙක් විය.

ජනතාව වෙනුවෙන් ආරෝග්‍ය ශාලාවක් තැනූ ඔහු ; දිනක් එය බැලීමට ගිය විට ; වෛද්‍යවරයෙක් අමුත්තන්ගේ පොතේ නම ලියන මෙන් ඔහුගෙන් ඉල්ලා සිටියේය. "මට ලියන්න බැහැ, හේතුව මම කවදාවත් පාසල් ගිහින් නැහැ" ධනවතා කීවේය. "මො-නවා ! ඔබට ඔබට කොහෙත්ම ලියන්න බැරිද ? ඔබ කියවන්නට, ලියන්නට පුංචි කාලේ ඉගෙන ගත්තා නම් මේ වෙනකොට ශ්‍රේෂ්ඨ මිනිසෙක් !" වෛද්‍යවරයා පැවසීය.

පොහොසත් මිනිසා මෙසේ කීවේය. "මම හිතන්නේ එහෙම නම් මම තාමත් නිකම්ම නිකම් මුරකාරයෙක් විතරයි."

උපදෙස : උත්සහවන්තකම තිබේ නම් අපි කාටත් දියුණුවෙන්න පුළුවනි.

### නෙත්මිණි ජයසූරිය

8 ශ්‍රේණිය සිංහල භාෂා පාසල රොක්ස්බර්ග් පාක්

## සිංහල අලුත් අවුරුද්ද

සිංහල අලුත් අවුරුද්ද සෑම වසරකම අප්‍රේල් 13 සහ 14 වෙනිදා පවත්වනු ලබයි. අවුරුදු ළඟාවන විට කොහො කෑගහන්නට පටන් ගනියි.

ඒ කාලයට අපි ගෙවල් පිරිසිදු කර මකුළු දැල් කඩනයා. මේ කාලයට මල් සහ පලතුරු බොහෝ හට ගනියි. ගමේ හැමෝම එකතු වෙලා අවුරුදු උත්සවයක් පවත්වනු ලබනවා. මෙම උත්සවයේදී මුලින්ම කිරි උතුරුවයි. මෙහිදී සිදු කරන අවුරුදු චාර්ත්‍ර කිහිපයක් තිබේ. ආගමික වතාවත්, ළිප ගිනි මෙළවීම, ආහාර පිසීම හිස තෙල් ගෑම, දෙමාපියන්ට බුලත් දී වැඳීම වැදගත් චාරිත්‍ර කිහිපයක්.

අලුත් අවුරුද්දට කිරි බත්, කැවුම්, කොකිස්, අතිරස වැනි කෑම සාදා පවුලේ සැමදෙන එක්ව භුක්ති විඳිනවා. ඒක හරි අපූරු අත්දැකීමක්.

### කවීෂා තරිංදි දන්වත්ත ලියනගේ

7/8 ශ්‍රේණිය
සිංහල භාෂා පාසල රොක්ස්බර්ග් පාක්